**ගැටුම්වල බලපෑමට ලක්වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතිය (සීඒආර්ර්)- සංරචක-සී, - 2014**

-----------------------------------------------------------------------------------------------------------

ගැටුම්වල බලපෑමට ලක්වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතියේ සංරචක-සී, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසංබැ) අතර 2010 ජූනි 07 දින එළඹි අංක 2626 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ 2 උපලේඛනයේ II ආ වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

------------------------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව, එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, උතුරු පළාත් සභාව හා උතුරු මැද පළාත් සභාවේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සංරචක- සී ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. මූලික සමාජ සේවා දියුණු කිරීම මඟින් ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රදේශවල ජන ජීවිතය, ආර්ථික යටිතල පහසුකම් සහ පරිපාලන හා නීති සේවා ස්ථාපිත කිරීම හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, සංරචක-සී ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 4,413.78 කට සමාන එජඩො මිලියන 39.06 ක් වූ අතර ඉන් රු. මිලියන 3,985.51 කට සමාන එජඩො මිලියන 35.27 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 ජූනි 07 දින ආරම්භ කරන ලද අතර 2014 නොවැම්බර් 30 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත් 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි.ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් ද තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අග්‍රිම ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව , සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2007 අගෝස්තු 07 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනට ප්‍රථම විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස්කර විගණනයට ඉදිරිපත්කර තිබුණේ 2016 ජනවාරි 28 දිනදීය.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

ණය අරමුදලින් කොන්ත්‍රාත්කරුවකු විසින් ප්‍රසම්පාදනය කළ රු. මිලියන 2.46 ක් වටිනා මැණුම් උපකරණ ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් ලෙස සලකනවා වෙනුවට අදාළ කොන්ත්‍රාත්තුවේ පිරිවැය ලෙස සලකා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිලිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් 2014 වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසංබැ | 35.27 | 3,985.51 | 1,852.00 | 20.49 | 2,648.43 | 46.58 | 6,066.38 |
| ශ්‍රීලංර | 3.79 | 428.27 | 71.50 | 2.15 | 277.59 | 5.97 | 773.85 |
| එකතුව | 39.06 | 4,413.78 | 1,923.50 | 22.64 | 2,926.02 | 52.55 | 6,840.23 |

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ සී සංරචකය යටතේ උතුරු හා උතුරු මැද පළාත්වල සුළු හා මධ්‍යම වාරි පද්ධති 10 ක් පුනරුත්ථාපනය හා රාජ්‍ය පරිපාලන ගොඩනැගිලි 10 ක් යලි ඉදිකිරීමේ කටයුතු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ලැබුණු තොරතුරු අනුව, උතුරු පළාත් සහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පරිපාලිත වාරි පද්ධති පුනරුත්ථාපනය සඳහා කොන්ත්‍රාත් 205 ක් මෙන්ම , උතුරු මැද පළාත් සහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පරිපාලිත වාරි පද්ධති පුනරුත්ථාපනය සඳහා විවිධ කොන්ත්‍රාත් 20 ක් ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසන් දිනය වන විට සම්පූර්ණ කර තිබුණි. කෙසේ වෙතත් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් පිරිනමන ලද කුඩා පරිමාණ කොන්ත්‍රාත් 287 ක් අතුරින් කොන්ත්‍රාත් ආරම්භ කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් එවැනි කොන්ත්‍රාත් 07 ක් අත්හිටුවා තිබුණි. තවද, රාජ්‍ය පරිපාලන ගොඩනැගිලි යලි ඉදිකිරීම සඳහා පිරිනමන ලද කොන්ත්‍රාත් 33 ක් ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසන් දිනය වන විට සම්පූර්ණ කර තිබුණි. ව්‍යාපෘතිය විසින් පුනරුත්ථාපන වැඩ මත සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂණවලදී සිදුකළ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) මුලතිව් දිස්ත්‍රික්කයේ කල්විලන්කුලම් ජලාශයේ පුනරුත්ථාපන වැඩ කොන්ත්‍රාත්කරු විසින් ප්‍රමාණවත් පරිදි සිදුකර නොමැති බව ක්ෂේත්‍ර පරීක්ෂණ අවස්ථාවේදී නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස නිවැරදි ලෙස පස් තැලීම සිදුකර නොතිබීම නිසා ජලාශ බැම්මේ ස්ථාන කිහිපයක්ම පළුදු වී ඇත.

(ආ) මීටර 80 ක දිගින් යුත් උදයාර්කාඩු ජලාශයේ බැම්ම සඳහා ඉරිගල් ආරක්ෂණය යථා පරිදි සම්පූර්ණ කර නොතිබුණු බව නිරීක්ෂණය විය. ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ පැහැදිලි කිරීම්වලට අනුව, ව්‍යාපෘතිය විසින් ප්‍රතිපාදිත අරමුදල් සීමා කිරීම හේතුවෙන් බැම්මේ අවශ්‍යම ස්ථාන සඳහා පමණක් ඉරිගල් සපයා ඇත.

(ඇ) මුලතිව් දිස්ත්‍රික්කයේ විශ්ව මඩු ජලාශයේ බැම්ම ශක්තිමත් කිරීමේ අරමුණින් සිදුකළ පස් තැලීම් පරීක්ෂණ සඳහා රු. මිලියන 17.82 ක් වැයකර තිබුණද පස් තැලීම් නිසි පරිදි සිදු නොකිරීම නිසා බැම්ම ස්ථාන 06 කදී දැඩි ලෙස පළුදු වී ඇත. තවද, රු. 286,000 ක පිරිවැයකට බැම්මේ සිදු කළ තණ පිඩැලි ඇල්ලීමේ වැඩ, වියලි කාලය තුළ පිඩලි සහිත පොළොව නඩත්තු කිරීම සඳහා නිවැරදි පරිචයන් නොමැති වීම හේතුවෙන් පසුව අසාර්ථක වී ඇති බව ක්ෂේත්‍ර පරීක්ෂණයේදී අනාවරණය විය.

(ඈ) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පුතුමුරිප්පු ජලාශ බැම්ම පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් කළුගල් ඝනමීටර 2238 ක් ඉවත් කිරීමට ඇස්තමේන්තු කර ඇතිබව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් ඉදිරිපත් කළ තොරතුරු අනුව, කළුගල් ඝන මීටර 1229 ක් පමණක් ඉදිරිපත් කර තිබුණු අතර ඉවත්කරන ලද තත්‍ය කළුගල් ප්‍රමාණය තහවුරු කර ගැනීමට කිසිඳු ලිඛිත සාක්ෂියක් විගණනය වෙත ඉදිරිපත් නොවීය. ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ පැහැදිලි කිරීම්වලට අනුව, දළ උපකල්පිත පදනම මත, ඉවත්කළ යුතු කළුගල් ප්‍රමාණය පිළිබඳ ඇස්තමේන්තු කළ අතර ඉවත්කළ තත්‍ය කළුගල් ප්‍රමාණය ඇස්තමේන්තු ප්‍රමාණයට වඩා විශාල ලෙස අඩු වී ඇත.

(ඉ) 2013 දී රු. මිලියන 1.83 ක පිරිවැයකට ව්‍යාපෘතිය විසින් නිමකරන ලද කිලිනොච්චි දිස්ත්‍රික්කයේ උත්පලවන්කලපු ලුණු ජලය ඉවත්කිරීමේ යෝජනා ක්‍රමයේ පුනරුත්ථාපන වැඩ අදාළ ජලාශ බැම්මේ ස්ථාන කිහිපයක්ම පළුදු වීම නිසා අදාළ කාර්යයන් සඳහා ඵලදායීව උපයෝජනය කර නොතිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ පැහැදිලි කිරීම්වලට අනුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් පසු නඩත්තු වැඩ සිදුකර නොතිබුණි. තවද, ගංවතුර කාලයේදී ඔවුන්ගේ නිවාස ජලයෙන් යටවීම හේතුවෙන් එම ප්‍රදේශයේ නිවැසියන් ජලාශ බැම්ම අනවසරයෙන් අල්ලා ගෙන බැම්ම පළුදු කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

එකතු කළ අගය මත බදු සඳහා ඔවුන්ගේ ලියාපදිංචිවීම්වල වලංගුතාවය තහවුරුකර ගැනීමකින් තොරව සිවිල් වැඩවල නියුතු කොන්ත්‍රාත්කරුවන්ට එකතු කළ අගය මත බදු සඳහා ව්‍යාපෘතිය ගෙවීම් කර තිබුණු බව නිරීක්ෂණය විය. එම නිසා එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචිවීම් අක්‍රීය වී තිබුණු කොන්ත්‍රාත්කරුවන් 28 කට එකතු කළ අගය මත බදු එකතුව රු. මිලියන 32.27 ක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

## 3.4 ව්‍යාපෘති කාර්යයන් නිම කිරීම

-----------------------------------

2014 නොවැම්බර් 30 වන විට ව්‍යාපෘති කටයුතු අවසන් වුවද ව්‍යාපෘතිය ගිණුම් වසා දැමීමට හා සකස් කර ඉදිරිපත් කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි.